# චතාරික සමයේ දෙවන සතිය
# අඟහරුවාදා

## පළමුවන කියැවීම

ඉසයියස් දිවැස්ප්‍රසාදිතුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

ඉසයියස් 1: 10, 16-20

**යහපත කරන්නට ඉගෙන යුක්තිය ඉටු කරන්න.**

එම්බා ජෙරුසලම! ඔබේ ප්‍රධානීහු ද සෙනඟ ද සොදොමේ හා ගොමෝරාවේ සිටි අය වැනිය. සමිඳුන් වදාරන දේට සවන් දෙන්න. දෙවිඳුන් උගන්වන දේ සිතට ගන්න. ස්නානය කොට පිරිසිදු වන්න. මා ඇස් හමුයෙන් ඔය පව් දුරු කරන්න. නපුරුකම් තවත් නොකරන්න. යහපත කරන්නට ඉගෙන ගන්න. පීඩා විඳින්නන්ට පිහිට වන්න. අනාථයන්ගේ හිමිකම් රැක දෙන්න. වැන්දඹුවන් උදෙසා ඉදිරිපත් වන්න. මෙසේ යුක්තිය ඉටු කරන්න. “එන්න, අපි මේ ගැන සාකච්ඡා කරමු” යි සමිඳාණෝ වදාරන සේක. “නුඹලාගේ පව් රතට රතේ තිබෙන නමුත්, ඒවා හිම මෙන් සුදු වන්නේය. තද රතු පැහැයෙන් තිබෙන නමුත් සුදු ලොම් මෙන් වන්නේය. නුඹලා සිය කැමැත්තෙන් කීකරු වන්නහු නම් දේශයේ සාරවත්කම භුක්ති විඳින්නහුය.
අකීකරු වී කැරලි ගසන්නහු නම් කඩුවෙන් මැරුම් කන්නහු ය. සමිඳාණෝ සිය සිරි මුවෙන් මෙය වදාළ සේක.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 50 : 8–9, 16–17, 21, 23

පිළිතුර: මට කීකරු වන හැම දෙන ම මම සැබැවින්ම ගළවා ගන්නෙමි.

ගීය:

නුඹලාගේ පූජා ගැනවත්, නිරතුරු මා වෙත ගෙනන දවන යාග පූජාවන් ගැනවත් මම දොස් නොපවරමි. එහෙත් නුඹේ පට්ටිවලින් ගොනුන් වත්, නුඹේ ගාල්වලින් එළුවන් වත් මට වුවමනා නැත.

එහෙත් දුදනා හට දෙවිතුමාණෝ මෙසේ වදාරණ සේක. “නුඹ මාගේ ආඥා කටපාඩමින් කියන්නේත්, මාගේ ගිවිසුම ගැන කතා කරන්නේත් කුමකට ද? මන්ද, නුඹ මාගේ අවවාදය නුරුස්සන්නෙහි ය. මාගේ වචනවලට පිටුපා යන්නෙහි ය.”

මේ සියල්ල නුඹ කෙළෙහි ය. මම කිසිවක් නොකීවෙමි. ඒ නිසා, “මාත් නුඹ වාගේ ම ය”යි නුඹ සිතුවෙහි ය. එහෙත් දැන් මම නුඹට දොස් පවරන්නෙමි. නුඹට කරුණු පහදා දෙන්නෙමි. ස්තුති පූජා පුදන තැනැත්තේ මට ගෞරව කරයි. මට කීකරු වන හැම දෙන ම මම සැබැවින් ගළවා ගන්නෙමි.

## සාධුකාරය

“මනස්ථාපනය වන්න. ස්වර්ග රාජ්‍යය ආසන්න ය.”

# සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 23: 1-12

### *"ඔව්හු එකක් කියති. අනෙකක් කරති."*

එකල ජේසුස් වහන්සේ සමූහයාටත් සිය ශ්‍රාවකයන්ටත් කතා කොට මෙසේ වදාළ සේක. විනයධරයෝ ද පරිසිවරු ද මෝසෙස්ගේ ව්‍යවස්ථාවලිය පිළිබඳ බලය ලත් අටුවාචාරීහු වෙති. එබැවින් ඔවුන් ඔබට අණ කරන සියල්ල නොපිරිහෙලා පිළිපදින්න. එහෙත් ඔවුන්ගේ ක්‍රියා අනුව නොයන්න. ඔව්හු එකක් කියති. අනෙකක් කරති. ඔව්හු ඉසිලිය නොහැකි මහ බර පොදි බැඳ මිනිසුන්ගේ කරේ තබති. එහෙත් ඒ බර පොදි ඉසිලීමට සුළැඟිල්ලක තරම් වත් ආධාරයක් දීමට කැමති නොවෙති. ඔවුන් හැම දෙයම කරන්නේ මිනිසුන්ට පෙනෙන පිණිස ය. ඔව්හු ශුද්ධ ලියවිලි පාඨ සඳහන් බඳන පලල් කරගෙන නළලෙහි ද බාහුවල ද පළඳිති. වස්ත්‍රවල දාවුලු මහත් කරති. මංගල්‍යය භෝජනවලදී මුලාසනයට ද ධර්ම ශාලාවලදී ප්‍රධාන අසුන්වලට ද වෙළඳ පොළවල දී ගෞරවාචාර ලැබීමට ද, මිනිසුන් විසින් "ගුරු දේව" කියා අමතනු ලැබීමට ද ප්‍රිය වෙති. එහෙත් ඔබ "ගුරු දේව" යයි කියවා නොගන්න. ඔබේ ගුරුදේවයාණෝ එක්කෙනෙක් මය. ඔබ කවුරුත් සහෝදරයෝ ය. මිහිපිට කිසිවෙකුට "පියාණෝ" යයි නොකියන්න. ඔබට ඇත්තේ ස්වර්ගයෙහි වැඩ වසන එකම පියාණන් වහන්සේ ය. ඔබ "නායකයෝ" යි කියවා නොගන්න. ඔබේ නායකයාණෝ එක්කෙනෙක් ම ය. එනම් ක්‍රිස්තුස් වහන්සේ ම ය. එහෙත් ඔබ අතරෙන් ඉතා උතුම් තැනැත්තා ඔබගේ සේවකයා වන්නේය.

තමා ම උසස් කරගන්නා කවරෙකු වුව ද පහත් කරනු ලබන්නේ ය. තමාම පහත් කරගන්නා කවරෙකු වුව ද ඔහු උසස් කරනු ලබන්නේය.

**සුවිශේෂ වාක්‍යය එසේ ය.**